# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2164/63 – 2020 පෙබරවාරි 28 වැනි සිකුරාදා – 2020.02.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ලග්ගල පල්ලේසිය පත්තුව සුළු කොට්ඨාසයේ, ගුරුවෙල (භූ. මූ. පි. 13 තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Ma/LGG/2015/403 හා 2016.05.09 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – ඉල්ලගහලන්ද – ප්‍රමාණය: හෙක්. 1.1673**
උතුරට: මිරියකන්ද ඇළ; නැගෙනහිරට: රජය හිමිකම් කියන මීරියකන්ද කැළය; දකුණට: ඇළ සහ නිකවතුර ඔය; බටහිරට: නිකවතුර ඔය.

02. **කැබලි අක්ෂර 'B' – ඉල්ලගහලන්ද – ප්‍රමාණය: හෙක්. 0.8039**
උතුරට: ඇළ; නැගෙනහිරට: ඇල සහ රජය හිමිකම් කියන මීරියකන්ද කැළය; දකුණට: ඊ. එම්. මුතුබණ්ඩා හිමිකම් කියන මීරියකන්ද ඉඩම; බටහිරට: කැබලි අක්ෂර C.

03. **කැබලි අක්ෂර 'C' – ඉල්ලේගොල්ල – ප්‍රමාණය: හෙක්. 0.5787**
උතුරට: නිකවතුර ඔය සහ ඇළ; නැගෙනහිරට: කැබලි අක්ෂර B; දකුණට: ඊ. එම්. මුතුබණ්ඩා හිමිකම් කියන මීරියකන්ද ඉඩම; බටහිරට: නිකවතුර ඔය.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මාගේ අංකය : DL/05/2009/MV/177
2019 සැප්තැම්බර් මස 23 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
මිහිකත මැදුර,
1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03- 573